# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2022.07.20

වර්ෂ 2022 ක් වූ ජූලි මස 20 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජූලි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**<u>මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු</u>**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
05. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
07. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
08. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
10. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u> ඃ-**

**<u>01. 2022-06-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022-06-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022-06-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2022-05-09 වන දින රට තුළ ඇතිවූ කළහකාරී සිදුවීම සම්බන්ධව 2022-05-18 වන දින පැවති මහා සභා රැස්වීමේදී තමා විසින් දක්වන ලද අදහස් 2022-06-15 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සඳහා සංශෝධන ලෙස ඇතුළත් නොවීම නිසා මෙම මහා සභා රැස්වීමේ වාර්තාවට විරුද්ධ බවට ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2022-06-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන රහිතව බහුතරයෙන් සභා සම්මත විය.

(පෙ.ව. 09.45ට ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය, ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සහ ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u> ඃ-**

අටවන විධායක ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් සිදුකරන බැවින් අද දිනය ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ ඉතා වැදගත් දිනයක් බවත්, රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හමුවේ අප ප්‍රාදේශීය සභාව මගින් ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල වැඩ කටයුතු අවසන් කර ගැනීමට බාධාවන් මතු වූ බවත්, කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ අත්තිවාරම් කටයුතු මේ වන විට අවසන්කොට ඇති බවත්, ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල වැඩි වූ නිසා කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු සහ සිට්ට්‍රස් වත්ත ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු සඳහා ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත් ආයතන එම ගිවිසුම්වලින් ඉවත්වීම සඳහා ඉල්ලීම් කොට ඇති බවත්, මෙම

ව්‍යාපෘති දෙක සඳහා නව මිල ගණන් යටතේ නැවත ඇස්තමේන්තු සකස්කර ටෙන්ඩර් කැඳවා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බවත්, මේ වනවිට මෙම සංවර්ධන ව්‍යාපෘති දෙක නතරකොට ඇති බැවින් ගිවිසුම් අවලංගු කිරීමට කටයුතු කරන බවත්, සිට්ට්‍රස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත්, කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු තාවකාලිකව නවතා නැවත කලේගාන පොළ ඉදිකිරීමට බලාපොරොත්තු වන බවත්, මෙම සභා වාරයේදී එක් කොට්ඨාශයක් සඳහා රුපියල් ලක්ෂ තිහකට වැඩි ප්‍රතිපාදන ලබාදීමට හැකි වූ බවත්, ඊට අමතරව වොට් 150 එල්.ඊ.ඩී වීදි ලාම්පු කට්ටල 400කට වැඩි සංඛ්‍යාවක් මුළු සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි සවිකිරීමට හැකි වූ බව සහ එක් කොට්ඨාශයක් සඳහා වීදි පහන් කට්ටල 150ක් පමණ සවිකිරීමට හැකි වූ බවත්, කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු සඳහා මේ දක්වා රුපියල් මිලියන 18ක පමණ මුදලක් ගෙවා ඇති බවත්, සිට්ට්‍රස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු සඳහා මේ වන විට රුපියල් මිලියන 3ක පමණ මුදලක් ගෙවා ඇති බවත්, අද වනවිට රුපියල් මිලියන 75ක පමණ මුදලක් සභාවේ ගිණුම්වල ඇති බවත්, තමා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන ලද්දේ අර්බුදකාරි කාලවකවානුවක බවත්, 2018 මාර්තු 29 වන දින තමා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස දිවුරුම් දෙන අවස්ථාව වන විට පැවතියේ යහපාලන රජය බවත්, යහපාලන රජය යටතේ අවුරුදු එක හමාරක පමණ කාලයක් වැඩ කටයුතු සිදුකළ බවත්, 2020 වර්ෂයේ සිට කොරෝනා වසංගතයට මුහුණ දීමට සිදුවූ බවත්, ඉන්පසු රටේ මූල්‍ය අර්බුදයට මුහුණ දීමට සිදුවූ බවත්, මෙම කාලය තුළ සභාවට ලැබිය යුතු ආදායම අඩුවූ බවත්, එසේ වුවද කොරෝනා වසංගත කාලයේදී රුපියල් ලක්ෂ 40කට වැඩි මුදලක් වැයකරමින් බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ පවුල් 8000ක ජනතාවට සහනාධාර ලෙස වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීමට හැකි වූ බවත්, සභාවේ ජේ.සී.බී යන්ත්‍රය හා කුලී පදනම මත ලබාගත් එක්ස්කැවේටර් යන්ත්‍ර යොදාගෙන බල ප්‍රදේශය තුළ ඇති කාණු සුද්ධ පවිත්‍ර කළ බවත්, සභාවේ මූල්‍ය තත්ත්වය වර්ධනය කර ගනිමින් සභාව මේ තත්ත්වයට ගෙන ඒමට හැකි වූ බවත්, ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ගණන් වැඩිවීම නිසා තාවකාලිකව නවතා ඇති කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු හා සිට්ට්‍රස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු නැවත ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත්, 2023 වර්ෂය සඳහා අදාළ අයවැයට යෝජනා තිබේ නම් ඒවා හැකි ඉක්මනින් ලබා දෙන ලෙසත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(පෙ.ව 09.55 ට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සහ ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** අප ප්‍රාදේශීය සභාවේ මීපාවල උප කාර්යාලයේ පුරප්පාඩු වී ඇති ආදායම් පරීක්ෂක තනතුරේ වැඩ බැලීම සඳහා ආයතන සංග්‍රහය සහ අදාළ ගෙවීම් චක්‍රලේඛ අනුව වැඩ බැලීමේ දීමනාවක් සහිතව ප්‍රධාන කාර්යාලයේ අදායම් පරීක්ෂක තනතුරේ සේවය කරනු ලබන කුමාරවඩුගේ පත්මිල කුෂාන්ත මයා පත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවේ මීපාවල උප කාර්යාලයේ පුරප්පාඩු වී ඇති ආදායම් පරීක්ෂක තනතුරේ වැඩ බැලීම සඳහා ආයතන සංග්‍රහය සහ අදාළ ගෙවීම් චක්‍රලේඛ අනුව වැඩ බැලීමේ දීමනාවක් සහිතව ප්‍රධාන කාර්යාලයේ අදායම් පරීක්ෂක තනතුරේ සේවය කරනු ලබන කුමාරවඩුගේ පත්මිල කුෂාන්ත මයා පත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 170 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරු කිරීමට යෝජනා කරමි.

| ඌනතා වූ වැය විෂයන් | | | අතිරික්ත වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|
| වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) | වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) |
| 103-1 | සැපයුම් ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 300,000.00 | 102-1 | ගමන් වියදම් | 300,000.00 |
| 105-8 | මුද්‍රණ වියදම් | 110,000.00 | 101-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 110,000.00 |
| 109-1 | ප්‍රාග්ධන වැය | 280,000.00 | 105-9-1 | වෙනත් වියදම් | 280,000.00 |
| 203-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 1,800,000.00 | 101-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 500,000.00 |
| | | | 201-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,300,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

රට තුළ පවතින අර්බුදකාරී තත්ත්වය යටතේ ලිපිද්‍රව්‍යවල මිල සහ ඉන්ධන මිල ඉහළ යාම නිසා ඌනතාවයන් ඇති වූ වැය විෂයන් සඳහා ගමන් වියදම් හා අතිකාල දීමනා සීමා කිරීම නිසා අතිරික්ත වූ වැය විෂයන්වලින් ඒ සඳහා අවශ්‍ය මුදල් මාරු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 170 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරු කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

| ඌනතා වූ වැය විෂයන් | | | අතිරික්ත වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|
| වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) | වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) |
| 103-1 | සැපයුම් ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 300,000.00 | 102-1 | ගමන් වියදම් | 300,000.00 |
| 105-8 | මුද්‍රණ වියදම් | 110,000.00 | 101-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 110,000.00 |
| 109-1 | ප්‍රාග්ධන වැය | 280,000.00 | 105-9-1 | වෙනත් වියදම් | 280,000.00 |
| 203-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 1,800,000.00 | 101-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 500,000.00 |
| | | | 201-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,300,000.00 |

**03.** කලේගාන පොළ භූමියෙන් ඉවත් කිරීමෙන් පසු වෙන්දේසි කරන ලද උළු සහ දැව කොටස් පොත්වලින් කපා හැරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කලේගාන පොළ භූමියෙන් ඉවත් කිරීමෙන් පසු වෙන්දේසි කරන ලද උළු සහ දැව කොටස් පොත්වලින් කපා හැරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**04.** මොන්රෝවියාවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයෙන් කාබනික පොහොර කිලෝ එකක් රු.13.00 බැගින් මිලදීගෙන කිලෝ 25 කාබනික පොහොර මලු සකස්කර කාබනික පොහොර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගයක් වශයෙන් අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයේ යෙදෙන ජනතාවට සහ ගෙවතු වගාවේ නියතු ජනතාවට රු.400.00ක සහන මිලට අලෙවි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කාබනික පොහොර කිලෝ එකක් රු.8.00කට මිලදීගත් බැවින් සහ ඒ සමග නොමිලේ කාබනික පොහොර ලැබුණ බැවින් කාබනික පොහොර කිලෝ 25ක මල්ලක් රු.250.00කට අලෙවිකල බවත්, මේ වන විට කාබනික පොහොර කිලෝ එකක් රු.13.00කට ලැබෙන බැවින් කාබනික පොහොර කිලෝ 25ක මල්ලක් රු.400.00ක් බැගින් අලෙවි කිරීමට සිදුවන බවත්, අප ප්‍රාදේශීය සභාව හරහා කාබනික පොහොර මිලදී ලබාගත් පිරිස් ඒ වෙනුවෙන් සභාව වෙත ප්‍රසාදය පළ කරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව මොන්රෝවියාවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයෙන් කාබනික පොහොර කිලෝ එකක් රු.13.00 බැගින් මිලදීගෙන කිලෝ 25 කාබනික පොහොර මලු සකස්කර කාබනික පොහොර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගයක් වශයෙන් අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයේ යෙදෙන ජනතාවට සහ ගෙවතු වගාවේ නියතු ජනතාවට රු.400.00ක සහන මිලට අලෙවි කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**05.** වක්වැල්ල, හපුගල, බෝගහවත්ත, නො.47/22 ලිපිනයේ පදිංචි එන්.එන්.ඩී. ලලංග මහතාගේ නිවසට අනතුරුදායක ලෙස සෙව්වන්දි අමරසිංහ මහත්මියගේ ඉඩමේ ඇති මහෝගනී ගස් දෙක සහා අරමුදලින් කපා ඉවත් කිරීමටත්, මේ සඳහා යන වියදම සෙව්වන්දි අමරසිංහ මහත්මියගෙන් අයකර ගැනීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම අයකර ගැනීම අධිකරණ ක්‍රියාමාර්ගයක් හරහා සිදුකළ යුතු බැවින් කපන ලද ගස ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදලෙන් වැයවූ මුදල පියවාගෙන ඉතිරි මුදල ගස් හිමිකරු වෙත ලබාදිය හැකි බවත්, එබැවින් මේ සඳහා එකඟතාවය ලබාගෙන එම කාර්යය සිදුකිරීම සුදුසු බවට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභා පනත අනුව එම කාර්යය සිදුකිරීමට හැකියාව පවතින්නේ අධිකරණ ක්‍රියාමාර්ග හරහා බවත්, අනතුර ඉවත් කිරීම පළමුව සිදුකළ යුතු බවත්, අනතුරුදායක ගස කැපීම සඳහා වැය වූ මුදල් සභාව වෙත ගෙවීමට ගස් හිමිකරු කටයුතු නොකරන්නේ නම් අධිකරණ ක්‍රියාමාර්ග හරහා අදාළ අයකර ගැනීම් සිදුකළ යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම යෝජනාව සම්බන්ධව තම අදහස ඉදිරිපත් කළ බවත්, එබැවින් මෙම යෝජනාවට තමා විරුද්ධ බවට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

අධිකරණ ක්‍රියාමාර්ග ලබා ගන්නා බවට දැනුම් දුන් පසු ඇතැම් ගස් හිමියන් සභාවෙන් වැයවූ වියදම නැවත සභාව වෙත ගෙවීමට කටයුතු කරන බවත්, එසේ නොවන අවස්ථාවන් වලදී අධිකරණ ක්‍රියාමාර්ග ලබා ගන්නා බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව බහුතරයෙන් සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව වක්වැල්ල, හපුගල, බෝගහවත්ත, නො.47/22 ලිපිනයේ පදිංචි එන්.එන්.ඩී. ලලංග මහතාගේ නිවසට අනතුරුදායක ලෙස සෙව්වන්දි අමරසිංහ මහත්මියගේ ඉඩමේ ඇති මහෝගනී ගස් දෙක සහා අරමුදලින් කපා ඉවත් කිරීමටත්, මේ සඳහා යන වියදම සෙව්වන්දි අමරසිංහ මහත්මියගෙන් අයකර ගැනීමටත් මහා සභාව විසින් බහුතරයෙන් සභා සම්මත කරන ලදී.

**06.** නරාවල, කාසල්හිල් වත්තේ අංක 262 ඉඩම් කොටස ආසන්නයේ මාර්ගයේ මායිම් ලකුණු කර දෙන ලෙස බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව නරාවල, කාසල්හිල් වත්තේ අංක 262 ඉඩම් කොටස ආසන්නයේ මාර්ගයේ මායිම් ලකුණු කර දෙන ලෙස බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඉල්ලා යැවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(පෙ.ව 10.05 ට ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

<u>**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා**</u>

**07.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අප ප්‍රාදේශීය සභාවට අයත් භාවිතයට නොගන්නා ඉඩම් බදු දීමටත්, එම ඉඩම් බදු ගන්නා පුද්ගලයන්හට තාවකාලික ඉදිකිරීම් සිදුකිරීමට අවසර ලබාදීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කළද කිසිදු ගරු මන්ත්‍රීවරයෙකු විසින් මෙම යෝජනාව ස්ථිර නොකරන ලදී.

අප ප්‍රාදේශීය සභාව සතු ඉඩම් තාවකාලික භෝග වැවීමට බදු පදනම මත ලබාදීමට ගරු මන්ත්‍රීවරු විසින් එකඟතාවය පළ කලද, එම ඉඩම් වල තාවකාලික ඉදිකිරීම් සිදු කිරීමට අවසරය ලබාදීමට ගරු මන්ත්‍රීවරු විසින් එකඟතාවය ලබාදීමට අකමැත්ත පළ කරන ලද බැවින් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**08.** තොටගොඩ රිච්ඩ් පතිරණ මාවත ආරම්භක ස්ථානයේ ඇති පොදු ළිඳ භාවිතයට නොගන්නා බැවින් එම ළිඳ පිහිටි ඉඩම කම්බි කණු යොදා මායිම් සලකුණු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ළිඳ පිහිටි භූමිය ළිඳ පිහිටා ඇති ප්‍රමාණයට වඩා විශාල බැවින් ප්‍රදේශය භාර ග්‍රාම නිලධාරිද සම්බන්ධ කොට ගෙන මෙම බිම් කොටස වටකර කම්බි ගසා වැට ඉදිකළ යුතු බවට ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව තොටගොඩ රිච්ඩ් පතිරණ මාවත ආරම්භක ස්ථානයේ ඇති පොදු ළිඳ භාවිතයට නොගන්නා බැවින් එම ළිඳ පිහිටි ඉඩම කම්බි කණු යොදා මායිම් සලකුණු කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**09.** තොටගොඩ, හේනවත්ත මාර්ගය පිහිටා ඇත්තේ වගුරු සහිත ප්‍රදේශයක වන බැවින් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කොට ඇති මාර්ගය තැන් කිහිපයකින් කඩාගෙන ගොස් ඇති නිසා අප ප්‍රාදේශීය සභාවේ සේවක මහත්වරු සහ ජේ.සී.බී යන්ත්‍රය සහ ට්‍රැක්ටර් රථ යොදාගෙන හේනවත්ත මාර්ගය දෙපස පස් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා අවශ්‍ය පස් ලබාගත හැකි ස්ථාන පවතින බවත්, මෙම මාර්ගය අඩි 14ක මාර්ගයක් බවටත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අප ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදවා මෙම කාර්යය සිදු කළ හැකි බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව තොටගොඩ, හේනවත්ත මාර්ගය පිහිටා ඇත්තේ වගුරු සහිත ප්‍රදේශයක වන බැවින් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කොට ඇති මාර්ගය තැන් කිහිපයකින් කඩාගෙන ගොස් ඇති නිසා අප ප්‍රාදේශීය සභාවේ සේවක මහත්වරු සහ ජේ.සී.බී යන්ත්‍රය සහ ට්‍රැක්ටර් රථ යොදාගෙන හේනවත්ත මාර්ගය දෙපස පස් දමා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා**</u>

**10.** නරාවල කාසල්වත්තේ අංක 261 ඉඩම අසල සිට අංක 266 නිවස දක්වා මාර්ගය පැති බැම්මක් ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව නරාවල කාසල්වත්තේ අංක 261 ඉඩම අසල සිට අංක 266 නිවස දක්වා මාර්ගය පැති බැම්මක් ඉදිකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**11.** නරාවල, කාසල්වත්තේ අංක 262 ඉඩමේ මේ වනවිට අනාරක්ෂිත ලෙස අනවසර ගොඩනැගිල්ලක් ඉදිකරමින් පවතින අතර වහාම එම කටයුත්ත නතර කරවන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ඉඩමේ ඇති ගොඩනැගිල්ල එම ස්ථානයේ පැවතීම නුසුදුසු බවට රාජ්‍ය ආයතන කිහිපයක් විසින්ම දන්වා ඇති බවත්, එබැවින් මෙම ස්ථානයේ තවත් ගොඩනැගිලි ඉදිකිරීම මගින් අනාරක්ෂිත තත්ත්වයක් නිර්මාණය වන බැවින්, ඉදිරියේදී යම් අනතුරුදායක තත්ත්වයක් ඇති වුවහොත් එහි චෝදනාව සභාව වෙත එල්ල විය හැකි නිසා මෙම අනවසර ඉදිකිරීම් කටයුතු නැවැත්විය යුතු බවට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව නරාවල, කාසල්වත්තේ අංක 262 ඉඩමේ මේ වනවිට අනාරක්ෂිත ලෙස අනවසර ගොඩනැගිල්ලක් ඉදිකරමින් පවතින අතර වහාම එම කටයුත්ත නතර කරවන මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා**</u>

**12.** කලේගාන වෙළඳ සංකීර්ණය සාදා ගැනීමට නොහැකි බැවින්, එය පොළක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා නව මිල ගණන් යටතේ ඇස්තමේන්තු සකස්කොට නැවත ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන බැවින් මෙය අමතර පිරිවැයක් බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැයවන පිරිවැය අධික බැවින් පොළක් ලෙස සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බවත්, වෙළඳ සංකීර්ණයේ ස්ලැබ් එක යෙදීම සඳහා අධික පිරිවැයක් වැයවන බැවින් තාවකාලික වහලක් ඉදිකොට පොළක් ලෙස සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බවත්, වෙළඳ සංකීර්ණය හෝ පොළ හෝ යන දෙකෙන් එකක් ඉදිකරගැනීමට නොහැකි වුවහොත් සභාවට චෝදනා එල්ල විය හැකි බවත්, වෙළඳ සංකීර්ණයේ වැඩ අවසන් කිරීමට සභාවට මූල්‍ය හැකියාවක් නොමැති බවත්, වෙළඳ සංකීර්ණයේ පළමෙනි අදියරේ වැඩ අවසන් කිරීමට රුපියල් මිලියන 300ක පමණ මුදලක් අවශ්‍ය බවත්, ණය මුදලක් හෝ ලබා නොගෙන සභා අරමුදල් වලින් යෝජිත වෙළඳ සංකීර්ණය පොළක් ලෙස සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බවත්, සතියට දවස් දෙකක් පොළ පැවැත්වීමට බලාපොරොත්තු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මේ සඳහා ඇස්තමේන්තු සකස්කොට පිරිවැය සංසන්ධනය කරන ලෙසත්, වැය කිරීමට බලාපොරොත්තු වන පිරිවැය නැවත සභාව වෙත ආවරණය කරගත හැකි ලෙස කටයුතු කළ යුතු බවටත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය අතරමග නැවැත්වීම සුදුසු නොවන බවත්, සතියට දවස් දෙකක් පොළ පැවැත්වීම මගින් වැයවන පිරිවැය නැවත සභාව වෙත ලබා ගැනීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කලේගාන පොළ නොමැතිවීම නිසා වෙළෙන්දන් වක්වැල්ල මාර්ගය අසන්නයේ තබාගෙන භාණ්ඩ අලෙවි කරන බැවින් බස්රථ සහ අනෙකුත් වාහන සඳහා ගමනාගමනයට බාධා මතුව ඇති බවත්, බස් නැවතුමේ බස්රථ නැවැත්වීමට බාධා එල්ලවීමද මේ හරහා සිදුව ඇති බවත්, මෙම යෝජනාව ඉතා වැදගත් කාලෝචිත යෝජනාවක් බවත්, පොළ ඉදිකළ පසු මෙම භූමිය වල් වැදීමෙන් ආරක්ෂාවීමද සිදුවන බවත්, රටේ ආර්ථික ගැටළුව නැවත යථා තත්ත්වයට පත් විය හැකි දිනයක් කිව නොහැකි බවත්, පොළේ වහල ඉදිකිරීමේදී අවම මුදලක් වැයවන ආකාරයට කටයුතු කරන ලෙසත්, පොළේ වහල සඳහා අමානෝ ශීට් යොදන ලෙසත්, එම අමානෝ ශීට් නැවත වෙනත් පාවිච්චියකට යොදාගත හැකි වන පරිදි වහල වෙත යොදන ලෙසත් ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අප ප්‍රාදේශීය සභාවට මෙම අවස්ථාවේදී වැයකළ හැකි මුදල් ප්‍රමාණය බැලීමෙන් අනතුරුව මෙම කාර්යය සිදුකරන බවත්, දැනට සභාව සතුව පවතින රුපියල් කෝටි 7.5ක මුදලින් සිට්ට්‍රස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීම සඳහාද යෙදවිය යුතු බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කලේගාන වෙළඳ සංකීර්ණය සාදා ගැනීමට නොහැකි බැවින්, එය පොළක් ලෙස සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(පෙ.ව. 10.35ට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**13.** අබලන් තත්වයේ පවතින අප ප්‍රාදේශීය සභාව සතු පාරවල් කොන්ක්‍රීට් යොදා අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අබලන්ව ඇති මිහිඳු මාවත වැනි මාර්ග කොන්ක්‍රීට් යොදා හෝ අළුත්වැඩියා කළ යුතු බවට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අබලන් තත්වයේ පවතින අප ප්‍රාදේශීය සභාව සතු පාරවල් කොන්ක්‍රීට් යොදා අළුත්වැඩියා කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ-</u>**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2022-06-17 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II.** 2022-07-11 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ- නැත**

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ ජුනි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ ජුනි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

2022 වර්ෂයේ ජුනි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ- නැත**

**(උ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**2022 වර්ෂයේ ජූලි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.**

වැලිකැටියවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකරදෙන ලෙස ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

මෙම කර්මාන්තය ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු ඉදිරිපත් නොවන බවත්, නව ඇස්තමේන්තු අනුව එම කාර්යය සිදු කිරීමට හැකියාවක් ඇති බවටත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සිට්ට්‍රස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු වලින් ඉවත්වීම සඳහා ප්‍රේමදාස සහ පුත්‍රයෝ සමාගම විසින් ඉල්ලීමක් ඉදිරිපත් කොට ඇති නමුත් ඒ සඳහා සභාවට යෝජනාවක් ඉදිරිපත් වී නොමැති බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස එම ලිපිය සභාගත කල බවත්, ටෙන්ඩර් මණ්ඩලය මගින් ඒ සඳහා අවශ්‍ය තීන්දුව ලබා ගන්නා බවත්, ගෙවිය හැකි රේට්ස් ප්‍රමාණය අනුව අදාළ ගෙවීම් සිදු කරන බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

නීත්‍යානුකූලව ගෙවිය හැක්කේ මෙතෙක් ඉටු කරන ලද වැඩ කොටස් සඳහා බවත්, අවසාන මාස කිහිපය තුළ දී යකඩ සහ සිමෙන්ති මිල ඉතා ඉහළ ගිය බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා චක්‍රලේඛයක් නිකුත්කොට ඇති බැවින් ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කරන බවත්, ආදාහනාගාරයේ වැඩ ආරම්භ කරන විට සිමෙන්ති කොට්ටයක මිල රු.920.00ක් බවත්, නමුත් පසුගිය සතියේ වැඩ කරන විට සිමෙන්ති කොට්ටයක මිල රු.3000.00ක් බවත්, එම නිසා මුදලේ වෙනස ආවරණය කළ නොහැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කොන්ත්‍රාත්කරුටද අසාධාරණයක් නොවිය යුතු බවත්, යම් සීමාවක් තුළ අදාළ ගෙවීම් සිදුකළ යුතු බවත්, මෙම ඉල්ලීම සම්බන්ධව නීත්‍යානුකූලව තීන්දුවක් ලබාගත යුතු බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අදාළ ව්‍යාපෘති දෙක සඳහා ඉංජිනේරු සහ තාක්ෂණ නිලධාරි නිර්දේශ ලබාගෙන ටෙන්ඩර් කමිටුව හරහා තීන්දුවක් ලබා ගන්නා බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ආදාහනාගාරය ඉදිකිරීමට අදාළ ව්‍යාපෘතියේ බැංකු ඇපකරය නිදහස් කරන ලෙස ඉල්ලීම් කොට ඇති නමුත්, ව්‍යාපෘතිය අතහැර ගියා සේ සලකා කටයුතු කළ හැකි බවත් ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගිවිසුම අවසන් කළ පසු බැංකු ඇපකරය ලබාදිය යුතු බවත්, මේ සම්බන්ධව දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් චක්‍රලේඛයක් නිකුත්කොට ඇති බවත්, මෙය රට තුළ ඇති වූ අර්බුදකාරි තත්ත්වය නිසා කොන්ත්‍රාත්කරු ඉල්ලා සිටියහොත් එය ලබාදිය යුතු බවත්, එය සුවිශේෂි කාරණාවක් බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

රටේ අර්බුදය නීතිය හමුවේ නොසලකන බවත්, ඉටුකොට ඇති වැඩ කොටස්වලට අදාළව ඇප මුදල් රඳවා තබාගත යුතු බවට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අවසන් මිනුම් ලබාගෙන ගෙවීම් සිදුකර මාස තුනක් යනතෙක් 10%ක මුදල හා බැංකු ඇපකරය නිදහස් කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා හට සහ ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා හට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ වන විට නිවාඩු අනුමතකොට නොගෙන විදේශගත වී ඇති ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතින් ලැබෙන උපදෙස් අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u> :-**

I. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
II. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
III. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2022-08-17 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීමේ කටයුතු පෙ.ව 10.50 ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.